## ජේ.ආර්. ජයවර්ධන ඓතිහාසික පර්යේෂණ, ලේඛනාගාර හා පුස්තකාල මධ්‍යස්ථානය - 2015

-----------------------------------------------------------------------------------------------

ජේ.ආර්. ජයවර්ධන ඓතිහාසික පර්යේෂණ ලේඛනාගාර හා පුස්තකාල මධ්‍යස්ථානයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1988 අංක 77 දරන ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථාන පනතේ 7(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

--------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3. විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1. තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජේ.ආර්. ජයවර්ධන ඓතිහාසික පර්යේෂණ ලේඛනාගාර හා පුස්තකාල මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම වෙන වෙනම හඳුනාගෙන ගිණුම් ගත කළ යුතු වුවද එසේ හඳුනාගැනීමකින් තොරව ඉඩම් වෙනුවෙන්ද සියයට 5 ක ක්ෂය වෙන්කිරීම් සිදුකර තිබුණි.

(ආ) ක්ෂය ප්‍රතිශතය තීරණය කිරීමේදී වත්කමේ ඵලදායී ජීව කාලය සැලකිල්ලට ගත යුතු වුවත් ආයතනයේ මෝටර් රථ ක්ෂය කිරීමේදී ඵලදායී ජීව කාලය පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි.

(ඇ) කෞතුකාගාරයේ ඇති පෞරාණික වටිනාකමින් යුත් පාරම්පරික වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 2.2.2. ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානයට අනුබද්ධිත පෞද්ගලික සමාගමක රු. 5,000,000 ක් ආයෝජනය කර තිබූ අතර, එම සමාගම 2008 වර්ෂයේ වසා දමා තිබුණු අතර ආයෝජනය වෙනුවෙන් රු.700,000 ක් පමණක් ප්‍රතිපූර්ණය කර තිබුණි. මෙම ආයෝජනය තව දුරටත් උපලබ්ධි නොවන බව පෙන්නුම් කෙරෙන නමුත් ඒ වෙනුවෙන් ප්‍රමාණවත් වෙන් කිරීමක් සිදු කිරීමට හෝ ගිණුම් වල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට වූ ආයතනයේ පුස්තකාලයේ විකිණීම සඳහා තබා තිබූ රු.4,140,350 ක් වටිනා ඉතිරි පොත් තොගය සමාලෝචිත වර්ෂයේ ගිණුම්ගත කර නොතිබුණි.

### 2.2.3. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා කුලී පදනම මත ලබා දී තිබූ ගොඩනැගිලි වෙනුවෙන් 2012 වර්ෂයේ සිට අයවිය යුතු රු. 2,065,667 ක ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එමින් පැවති ආපසු ගෙවිය යුතු ගොඩනැගිලි කුලී තැන්පත් රු. 1,187,190 ක් හා ආපසු ගෙවිය යුතු ආරක්ෂක තැන්පතු රු. 1,154,624 ක් හඳුනාගෙන නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) ණයහිමි ශේෂය තුල ඇතුලත් රු. 294,471 ක් වූ 2011 හා 2012 වර්ෂ වලට අදාල විගණන ගාස්තු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3. නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
-----------------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | |
|---|---|
| (අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 4.2.2 ඡේදය හා 4.2.3 (අ) (ආ) ඡේද | මධ්‍යස්ථානයේ පාලක මණ්ඩල රැස්වීම් 2013 මාර්තු 08 දිනෙන් පසුව එනම් මාස 33 කට පසු 2015 දෙසැම්බර් 09 දින රැස්වී තිබීම හේතුවෙන් මාසික මූල්‍ය ප්‍රකාශන පාලක මණ්ඩලයට ඉදිරිපත් කිරීම කාර්ය සාධනය පිළිබඳ මාස 06 කට වරක් සාකච්ඡා කිරීම හා එහි වාර්තා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම යනාදී කාර්යයන් ඉටුකිරීමට නොහැකි වී තිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | එකතුව රු. 105,750,350 ක් වූ ස්ථාවර වත්කම් වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙනගොස් නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය
-------------

3.1. මූල්‍ය ප්‍රතිඵල හා විග්‍රහාත්මක සමාලෝචනය
---------------------------

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතුවලින් රු. 3,384,453 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු. 5,585,848 ක ඌනතාවයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 2,201,395 කින් අඩුවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 2,934,398 කින් අඩුවී තිබූ නමුත් සන්නිවේදන උපයෝගිතා සහ අනෙකුත් වියදම් රු. 6,397,733 කින් අඩුවී තිබීම ඌනතාවය අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂය දක්වා අඛණ්ඩ මූල්‍ය අතිරික්තයක් පැවති නමුත් 2014 හා 2015 වර්ෂ වල මූල්‍ය ඌනතාවයන් ඇතිවී තිබුණි. සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී මධ්‍යස්ථානයේ සමස්ත දායකත්වය 2013 වර්ෂයේ සිට 2015 දක්වා පිළිවෙලින් රු. 21,318,216, රු. 12,384,561 හා රු. 17,889,699 ක් විය. ඒ අනුව 2013 වර්ෂය ඉහල

දායකත්වයක් පෙන්නුම් කළ නමුත් පසු වර්ෂවලදී ඒ මට්ටම්වලින් පවත්වාගෙන යාමට නොහැකි වී ඇතත් එය වර්ධනය කර ගැනීම සඳහා වූ ක්‍රමෝපායන් කෙරෙහි අවධානය යොමුවී නොතිබුණි.

(ආ) ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ආයතනයේ ජංගම අනුපාතය 2015 හා 2014 වර්ෂවලදී පිළිවෙලින් 5.8:1 ක් හා 6.9:1 ක් විය. ජංගම වත්කම් වලින් සියයට 89 ක් කෙටිකාලීන ආයෝජන නියෝජනය වූ අතර ආයතනයේ විශාල වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් තුල රඳවා තිබුණි. එසේම රු. 4,140,350 ක් වටිනා ඉතිරි පොත් තොග ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ක්ෂණික වත්කම් අනුපාතයද ජංගම වත්කම් අනුපාතය හා සමාන විය.

4. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

4.1. කාර්යසාධනය
-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතාගේ ලියකියවිලි, ලිපිගොනු, සිහිවටන, ලැබූ ප්‍රදාන හා ත්‍යාග තැන්පත් කර තැබීම, ඒවා ආරක්ෂාව හා සංරක්ෂණය, ප්‍රදර්ශනය, විද්වත් රැස්වීම් පැවැත්වීම, රාජ්‍ය ලේඛනාගාරයට පවරනු ලබන සියළු වාර්තා හා මුද්‍රිත ද්‍රව්‍ය තබාගැනීම ආදිය මධ්‍යස්ථානයේ ප්‍රධාන අරමුණු වන අතර එම අරමුණු ඉටුකර ගැනීමට සකස් කර ඇති ක්‍රියාකාරී සැලැස්මේ රු. 25,952,400 ක මුළු ඇස්තමේන්තු ගත වටිනාකමින් සියයට 86 ක වැඩි ප්‍රමාණයක් එනම් රු. 22,500,000 ක ප්‍රමාණයක් ඉදිකිරීම් හා නවීකරණ කටයුතු වෙනුවෙන් වෙන්කර තිබූ අතර පනතේ අරමුණු ඉටුකර ගැනීමට යොදවා තිබුණේ සියයට 14 ක ප්‍රමාණයකි. ක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂය තුල ඉටුකිරීමට ඉලක්කගත කාර්යයන් 23 ක් සඳහා ඇස්තමේන්තු සකස් කර තිබුණද රු. 25,312,400 ක වටිනාකමෙන් යුත් කාර්යයන් 18 ක් ඉටුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය පරීක්ෂාවේදී මුළු ඉලක්ක ගත කාර්යයන් 23 න් 12 ක්ම ඉටු කිරීමේ වගකීම පවරා තිබූ කාර්මික හා පර්යේෂණ නිලධාරීන් 2015 වර්ෂය වන විට ආයතනයෙන් ඉවත්ව තිබූ අතර එම තනතුර සඳහා නිලධාරීන් පත්කර ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යයන් ඉටුකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

4.2. කළමනාකරණ ක්‍රියාකාරකම්
----------------------------------

(අ) ගොඩනැගිලි බදු කුලී ආදායම
--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2015 වර්ෂයේදී ගොඩනැගිලි කුලී ආදායම ලෙස රු. 13,045,782 ක මුදලක් ලැබී තිබුණ අතර රාජ්‍ය ආයතන 3 ක් හා පෞද්ගලික ආයතන 8 ක් ඇතුළුව ආයතන 11 ක් සඳහා ගොඩනැගිලි කුලියට ලබාදීමේදී තක්සේරු දෙපාර්තමේන්තුව මගින් මාසික කුලී තක්සේරු වාර්තාවක් ලබා නොගෙන විවිධ වර්ග අඩි ප්‍රමාණයන් විවිධ මාසික කුලී ප්‍රමාණ යටතේ කුලියට ලබාදී තිබුණි.

(ii) මාසික කුලිය රු. 40,000 බැගින් ආයතන දෙකක් සඳහා විධිමත් ගිවිසුමකට එළඹීමෙන් තොරව ගොඩනැගිලි කුලියට ලබාදී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුල මධ්‍යස්ථානය හා කුලී පදනම මත ලබාදුන් බදු ගොඩනැගිලි වෙනුවෙන් ජල බිල්පත් සඳහා රු. 434,555 ක් ගෙවා තිබූ අතර ජලය සඳහා කිසිදු මුදලක් බදු ගැනුම්කරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම සමහර බදු ගිවිසුම් වල ජල බිල්පත් ගෙවීම බදු ගැනුම්කරු විසින් ගෙවිය යුතු බව සඳහන්ව තිබියදීත් මධ්‍යස්ථානය විසින්ම සියලුම බිල්පත් ගෙවීම සිදුකර තිබුණි.

(iv) බදු ගිවිසුම් සකස් කිරීමේදී බදු කරුවන් විසින් භාවිතා කරන විදුලි වියදම් අයකර ගැනීම සඳහා ප්‍රතිපාදන ඇතුලත් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු. 3,024,814 ක් විදුලි බිල්පත් වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. බදු දෙන ලද ගොඩනැගිලි 9 කට වෙනම විදුලි මීටර සවිකර නොතිබීමද මේ සඳහා බලපා තිබුණි.

(ආ) 1988 අංක 77 දරන ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථාන පනතේ (3) ඡේදය ප්‍රකාරව ජනරජයේ ජනාධිපතිවරයා, ජීවත්ව සිටින ආදි ජනාධිපතිවරු, අගමැතිවරයා, කථානායකවරයා විරුද්ධ පක්ෂයේ නායකවරයා, ජනාධිපති ලේකම්, ජාතික ලේඛනාගාරයේ අධ්‍යක්ෂකවරයා හා ජනාධිපතිවරයා පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකුගෙන් පාලක මණ්ඩලය සමන්විත වේ. යථෝක්ත පුද්ගලයන් රැස්කරගෙන පාලක මණ්ඩල රැස්වීම් පැවැත්වීම ප්‍රායෝගිකව අපහසු වන බැවින් හා පාලක මණ්ඩලයේ අනුමැතියකින් තොරව ගනුදෙනු සිදුකරන බැවින් පාලක මණ්ඩල රැස්වීම් විධිමත්ව පැවැත්වීමට හැකිවන පරිදි පනත සංශෝධනය කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

**4.3.** මතභේදයට තුඩුදෙන ගනුදෙනු
-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යස්ථානයේ කටයුතුවලින් බාහිරව පවත්වාගෙන යන සුභ සාධක සංගමයේ ආපන ශාලාව සඳහා අරක්කැමි, අරක්කැමි සහායක හා කම්කරු වශයෙන් තිදෙනෙකු 2014 වර්ෂයේ බඳවාගෙන මධ්‍යස්ථානයේ අරමුදල් වලින් 2014 ජූනි මාසයේ සිට 2015 දෙසැම්බර් 31 දක්වා එකතුව රු. 1,453,310 ක වැටුප් හා වේතන ගෙවා තිබුණි.

(ආ) උපදේශක සේවා ගාස්තු
--------------------------

මධ්‍යස්ථානය විසින් ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් උපදේශකවරයෙකු බඳවා ගෙන 2014 වර්ෂයේදී දීමනා වශයෙන් රු. 3,569,456 ක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2007 අගෝස්තු නිකුත් කර ඇති උපදේශකවරුන් බඳවාගැනීම හා සේවයේ යෙදවීම පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4 ඡේදය ප්‍රකාරව තනි පුද්ගල උපදේශක වරයෙකුගේ සේවය ලබාගැනීමට අයදුම්කරුවන් 3 දෙනෙකු හෝ ඊට වැඩි ප්‍රමාණයක් අතුරින් සුදුසු පුද්ගලයෙකු තෝරා ගත යුතු වුවද එයට පටහැනිව අයදුම්පත් කැඳවීමකින් තොරව 2012 අගෝස්තු 01 සිට 2015 ජූලි 31 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා නිලධාරියෙකු බඳවාගෙන තිබූ අතර 4.6 ඡේදය ප්‍රකාරව තෝරාගන්නා ලද උපදේශකවරයා සමඟ විධිමත් ගිවිසුමකටද ඇතුලත්ව නොතිබුණි.

(ii) කොන්ත්‍රාත් මුදලින් උපදේශක ගාස්තු ලෙස සියයට 8 ක් එනම් රු. 1,311,421 ක් හා සුපරීක්ෂක ගාස්තු ලෙස දිනකට රු. 18,000 බැගින් රු. 2,258,034 ක් ද වශයෙන් එකම කාර්යයක් වෙනුවෙන් ගෙවා තිබුණි.

(iii) මධ්‍යස්ථානය බිම් මහලේ වැසිකිළි නවීකරණය හා මධ්‍යස්ථානයට නීත්‍යානුකූල අයිතියක් නොමැති බ්‍රේරේමා බිල්ඩින් ජනාධිපති නිල නිවාස නවීකරණය සඳහා පිළිවෙලින් රු. 1,063,043 ක් හා රු. 309,357 ක් සුපරීක්ෂක හා උපදේශක ගාස්තු 2014 වර්ෂය තුල ගෙවා තිබුණද මෙහි කිසිදු නවීකරණ කටයුත්තක් සිදුකර නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4.4. ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

-----------------------------------------

තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් දරන ලද රු. 7,995,665 ක වියදම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉංජිනේරුමය ඇස්තමේන්තුවකින් සහ මහ නගර සභාවේ සංවර්ධන බලපත්‍රයක් හා ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමකින් තොරව තෙමහල් ගොඩනැගිල්ල නවීකරණය සඳහා ප්‍රසම්පාදන කර තිබුණි. අවම මිල වූ රු. 6,451,086 කට ඉදිරිපත් කරන ලද කොන්ත්‍රාත්කරු සමඟ 2014 මාර්තු 15 දින ගිවිසුමට එළඹ තිබූ අතර 2014 ජූනි 15 දින වැඩ අවසන් කල යුතුව තිබුණි. බිම් මහල හා පළමු මහල වැඩ අවසන්කර තිබූ නමුත් දෙවන මහලේ ඉදිකිරීම් කටයුතු විගණන දිනය වූ 2016 මාර්තු 15 දින වනවිට අවසන් කර නොතිබුණි. කොන්ත්‍රාත්කරු ඉටුකල යුතු ඉතිරි වැඩ කොටස් ඉටුකර ගැනීමට හෝ විධිමත් පරිදි ගිවිසුම අවලංගු කිරීමකින් තොරව මෙතෙක් රඳවාගෙන තිබූ රු. 511,969 ක් වූ රඳවා ගැනීමේ මුදල් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ආ) යථෝක්ත කොන්ත්‍රාත්තුවට අදාල වූ ප්‍රමාණපත්‍රවල රු. 732,500 ක් ඇස්තමේන්තුකර තිබූ වානේ තරප්පුව හා වහලයක් සවිකිරීමේ වැඩ විෂයයන් ආයතනය විසින් ගිවිසුම් අත්සන් කර ගැනීමකින් තොරව වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු මඟින් ඉටුකරගෙන රු. 2,994,928 ක් ගෙවා තිබුණි. මේ අනුව මූලික ඇස්තමේන්තුවට වඩා රු.2,262,428 ක් වැඩියෙන් වැයකර තිබුණි. පළමු ගිවිසුම්කරු වෙත පවරන ලද කාර්යයන් වෙනත් පාර්ශවයක් මඟින් ඉටුකරවා ගැනීම හේතුවෙන් පළමු කොන්ත්‍රාත්කරු විසින් වැඩ අතරමග නවතා තිබූ බව විගණනයේදී අනාවරණය විය.

## 4.5. හඳුනාගන්නා ලද පාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සතුව රු. 91,002,055 ක ස්ථාවර තැන්පතු තිබියදී වාහන 2 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු. 238,900 ක් බැගින් වූ මාසික වාරික 120 කින් ගෙවීම් පදනම මත 2013 වර්ෂයේදී රු. 14,000,000 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට ණය පොලිය වශයෙන් රු. 4,438,651 ක් ගෙවා තිබූ බැවින් ආයතනයට මූල්‍යමය වශයෙන් පාඩුවක් සිදුවන බව නිරීක්ෂණය විය.

(ආ) ප්‍රශස්ථ තොග ප්‍රමාණයන් හඳුනාගැනීමකින් තොරව තොග රැස්කර තබාගැනීම හේතුවෙන් රු. 330,350 ක් වටිනා පොත් 955 ක් හානිවී තිබුණි.

## 4.6. කාර්ය මණ්ඩල පරිපාලනය

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව අනුමත කරගත් සංවිධාන සටහන හා කාර්ය මණ්ඩලය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළයුතු වුවද සංවිධාන සටහන හා කාර්ය මණ්ඩලය අනුමත කරගැනීමට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ගැනීම සිදුකර නොතිබුණි.

(ආ) මධ්‍යස්ථානයේ බඳවාගැනීම් පරිපාටිය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සේවක සංඛ්‍යාව සැසඳීමේදී 2012 වසරට සාපේක්ෂව 2013, 2014 වර්ෂයන්හිදි සේවක සංඛ්‍යාවේ වැඩිවීමක් දක්නට ඇති අතර 2015 වර්ෂයේදී සේවක සංඛ්‍යාවේ අඩුවීමක්ද 2012 වර්ෂයේදී රු.380,159 ක් වූ ඒකසේවක පිරිවැය 2015 වර්ෂයේදී රු. 529,780 දක්වා වැඩිවීමක්ද නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------------

### 5.1. අයවැය ලේඛනමය පාලනය

-------------------------------------

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අයවැය ලේඛනය 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 ඡේදයේ ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණු අතර අයවැයගත වියදම්, තත්‍ය වියදම් සමඟ සැසඳීමේදී සියයට 28 සිට 658 දක්වා වූ පරාසයක විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

### 5.2. වාර්ෂික වාර්තා සභාගත කිරීම

---------------------------------

2011 වර්ෂයෙන් පසුව මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

### 5.3. අභ්‍යන්තර විගණනය

------------------------

ආයතනයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොමැති අතර ජනාධිපති කාර්යාලය යටතේ පවතින ආයතනයක් බැවින් එම කාර්යාලය මඟින් හෝ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මධ්‍යස්ථානයේ ලේකම් ජනරාල් වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| ප්‍රධාන ක්ෂේත්‍ර | නිරීක්ෂණයන් |
| --- | --- |

| | | |
|---|---|---|
| (අ) | මූල්‍ය පාලනය | ආයතනයේ ප්‍රධාන අරමුණු ඉටු කිරීම සඳහා අරමුදල් යෙදවීම ප්‍රමාණාත්මක මට්ටමකින් සිදු නොවීම. |
| (ආ) | ආදායම් පාලනය | තක්සේරු වාර්තා ලබා නොගැනීම හා බදු ගිවිසුම් විධිමත්ව ක්‍රියාත්මක නොවීම. |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | කොන්ත්‍රාත්තුවලට අදාල ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය නොකිරීම. |
| (ඈ) | කාර්ය මණ්ඩල පරිපාලනය | බඳවා ගැනීමේ පරිපාටිය හා සේවක සංඛ්‍යාවන් අනුමත කර නොගැනීම. |
| (ඉ) | අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණනයක් සිදු නොකිරීම. |
| (ඊ) | තොග පාලනය | (i) තොග පොත් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොගැනීම.<br>(ii) ප්‍රශස්ථ තොග මට්ටම් හඳුනාගෙන ඒ අනුව කටයුතු නොකිරීම |